# 7

# පස්ගම නාථ දේවාලය හා පූජා චරිත්‍ර පිළිබඳව අධ්‍යයනක්

අජිත් තල්වත්ත

## හැඳින්වීම

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෝකේශ්වර නාථ හා නාථ දෙවියන් බවට පත්වී සංකල්පීය වෙනසකට ලක්ව, මහනුවර යුගය වන විට උන්වහන්සේට හිමි වූ වැදගත්කම වඩාත් වර්ධනය වේ. කන්ද උඩරට රාජ්‍යත්වය ක්‍රි. ව. 1815 වර්ෂයෙන් නිමාවට පත්වුවත් නාථ දේව වන්දනය මහනුවර ප්‍රදේශයේ ජනප්‍රිය දේව ඇදහීමක් බවට පත්ව තිබුණි. ඒ නිසා ම ප්‍රාදේශීය වශයෙන් ප්‍රධාන දේවාල ගණනාවක් ඉදි වී ඒ හා ආශ්‍රිත පුද පිළිවෙත් ගොඩනැගී ඇත. විශේෂයෙන් ම මහනුවර, වෑගිරිය, පස්ගම හා දොඩම්වල යන නාථ දේවාල නාථ දේව වන්දනයේ ජනප්‍රියතම දේවාල වේ. එකී දේවාල අතර මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පස්ගම නාථ දේවාල වැදගත් විය. අවලෝකිතේශ්වර නාථ වන්දනය රුහුණු ප්‍රදේශය කේන්ද්‍රගතව ගොඩනැගුනත් මහනුවර ප්‍රදේශය ඇසුරෙන් පමණක් දක්නට ලැබීම විශේෂත්වයකි. මෙම අධ්‍යයනය කොටස් දෙකකින් සමන්විතය. එනම් පස්ගම දේවාලයේ ඓතිහාසික පසුබිම හඳුනාගෙන ඒ ආශ්‍රිතව පවතින පූජා චාරිත්‍ර විධි පිළිබඳ විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනයේ දී උපයෝගී කරගනු ලබන පර්යේෂණ ක්‍රමයක් වන්නේ පූජා චාරිත්‍ර සිදුකරන ආකාරය නිරීක්ෂණය කිරීමයි. එම පූජා චාරිත්‍ර පවත්වනු ලබන අදාළ පාර්ශවයන්ගේ අදහස් මෙහි දී විමසා එහි පරමාර්ථ සාකච්ඡාවට බඳුන් කෙරේ. මෙම දේවාලය ඇසුරෙන් පවත්වන පූජා චාරිත්‍ර තුළ විශේෂත්වයක් ද ඇත.

## සාකච්ඡාව

දෙමළ භාෂාවෙන් තේවලම්, තේවාලයම් ලෙස පැවති එය දේවාලය යනුවෙන් සිංහලයට වෙනස් වූ බව පෙනේ. දේව යන්න ලතින් භාෂාවෙන් DEVS යනුවෙන් හැඳින්වෙන අතර එහි අර්ථය වන්නේ දීප්තිමත් යනුවෙනි (සුනිල් 2001:65-68).

දෙවියන් පිළිබඳ විශ්වාසය මිනිස් සිතිවිලි අතරට පැමිණියේ කිනම් කලක ද දේවාල බිහිවීම ද එවන් අතීතයකට දිව යන බව විශ්වාස කළ හැකිය. ක්‍රි. පූ. 3 වන සියවසේ සිදු වූ මහින්දාගමනයට පෙර සිට පවා දේවාල ඉදිවූ බවට සාක්ෂි හමුවේ. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී මෙරට දේවාල ඉදි කළ බව පෙනේ. තමා කුඩා කාලයේ පටන් ආරක්ෂා කළ කාලවේල හා චිත්තරාජ, වලවාමුඛී, ජුතින්දර ආදී යක්ෂ, යක්ෂනියන්ට දේවාල ඉදි කළ බවට *මහාවංසයෙහි* සඳහන් වේ (මහාවංසය 1996:පරි.10). අනුරාධපුරයේ බලයට පත් මහසෙන් රාජ්‍ය සමයේ දී ත්‍රිකුණාමලයේ පරකාවිල්ලකලන්ද වැනි ස්ථානයන්හි ශිව දේවාල ප්‍රමඛ මිථ්‍යාදෘෂ්ටික ආයතන විනාශ කර බෞද්ධ වෙහෙර විහාර ඉදි කළ බව තවදුරටත් මහාවංසය තුළින් හෙළි වේ (එම, පරි.37).

ක්‍රිස්තු වර්ෂ 1017 අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු අභිනව රාජධානියක් ලෙස චෝළයන් විසින් පොළොන්නරුව තෝරා ගන්නා ලදී. වසර 53 පමණ කාලයක් චෝළ බලපෑම ලංකා සමාජයට තදින් දැනුණි. පොළොන්නරු යුගයේ ද පාලකයින් දේව භක්තියට අවස්ථාවක් දුන් බව පැහැදිලිය. මේ අතර ශිව දේවාල හා ගණ දෙවි දේවාල විශේෂ ස්ථානයක් ගත්තේය. දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රමබාහු හට වැළදුණ රෝගයක් සුව කර ගැනීමට ලංකාවට ගෙන ආ ශාන්ති කර්මවල හා යාග හෝමවල දක්ෂ බමුණන්ට රජු පැහැදී තුටු පඬුරු දී දෙවොලක් සාදා ගැනීමට ඉඩ දී ඇත (ජයවර්ධන 1985:98). හය වෙනි පරාක්‍රමබාහු රජු ද මෙම දේවලයට ගම්බිම් පිදූ බවට තවදුරටත් සඳහන් වේ (එම). මේ අනුව පැහැදිලි වන්නේ පොළොනන්රු සමයේ දී දේවාල ඉදිවීම අඛණ්ඩ ව සිදු වූ බවයි. මෙම තත්ත්වය ගම්පොළ රාජධානි අවධියෙන් පසු ක්‍රමික ව වැඩිදියුණු වී මහනුවර සමයේ දී වඩාත් වැඩි වූ බව කිව හැකිය.

නාථ දේව වන්දනයෙහි වඩාත් ප්‍රසිද්ධියට පත් කන්ද උඩරට පිහිටි නාථ දේවාල අතර පස්ගම නාථ දේවාලය ද කැපී පෙනේ. පාතහේවාහැට හේවාවිස්ස ගමේ පිහිටි මේ දේවාලයට මහනුවර තලාතුඔය හරහා හඟුරන්කෙතට යන මාර්ගයේ මාරස්සනට මොබින් දකුණට වැටී ඇති හේවාවිස්ස මාවතෙන් ළඟාවිය හැකිය. වර්තමානය වන විට මෙහි වැදගත්කම ප්‍රකට වන්නෙ දේවාලය නිසා වුවත් එහි ඇති බෝධිය අනුරාධපුරයෙන් ගෙනා එකක් බව සැලකේ. නමුත් මෙම දේවාලය ගම්පොළ යුගයට අයත් බවට විශ්වාස කළ හැකිය. එම රාජධානි සමයේ විසූ තුන් වන වික්‍රමබාහු රජු විසින් මෙහි දේවාලයක් ඉදිකරවා එයට නාථ දෙවියන් වැඩම කරවීම නිසා පැරණි විහාර භූමියේ නැගෙනහිර පසින් නාථ දේවාලයක් ඉදිවිය (අභයවර්ධන 2004:97). නාථ දෙවිඳු දූම්බර සිට පස්ගමට වැඩම කර ඇති බව ද පැවසේ. මුල් අවධියේ දුම්බර බලවත් ම දෙවියා වූයේ නාථය. සොළී දේශයේ සිට පැමිණ පිටියේ බණ්ඩාර දෙවි සුන්දර ප්‍රදේශයක් වූ දුම්බර මිටියාවත

දැක එය සිය වාසභූමිය කර ගැනීමට අදිටන් කරගෙන ඇත (කරුණාතිලක 1985:63-67). නාථ හා පිටියේ දෙවියන් අතර ගැටුමක් උද්ගත වූ පසු සතුරන්ට සිදුවන හානිය දැක නාථ දෙවියන් පසු බැස තිබේ (අස්සජී 1998:109). පස්ගම යන නාමය යෙදී ඇත්තේ ද නාථ දෙවි පසුබැස ආ ගම යන අරුතින් බව ජනප්‍රවාදයේ වේ. මෙසේ පසු බැස ආ දෙවියන් කන්දහන්දියට (කැතිගන්නාවෙල) පැමිණි පසු ශුද්ධනා නැමැති පුද්ගලයා හමුවේ. ඔහු කුරක්කන් කපමින් සිටී. පස්ගම දේවාලය ආසන්නයේ ඇති ගලක් මත දෙවිඳු වැඩ සිටී. එම දෙවියන් වැඩ සිටි ස්ථානයෙහි පා සලකුනෙහි විලිඹු අඩි අද ද දක්නට ලැබේ. එම ස්ථානයෙහි දේවාලක් ඉදි කිරීමට අවශය උපදෙස් ලබාදී දෙවියන් නොපෙනී ගිය බවට ජනප්‍රවාදයේ සඳහන් වේ (අබේරත්න බණ්ඩා 2014.03.15: සාකච්ඡාව).

ගම්පොළ සමයට අයත් මෙම දේවාලයෙහි වැඩ සිටින නාථ දෙවියන්ගේ සහ තාරා දේවියගේ දේව ප්‍රතිමා රතු සඳුන් ලීයෙන් නිමවා ඇත. උඩවත්ත පාමුල පිහිටි සිසිල් පැන් කඳුර (හිල්පැන්කඳුර) දී එකී දේව රූප නිමවා ඇති බවට විශ්වාස කෙරේ (එම). වේගිරියේ මෙන් මෙහි ද තාරා දෙවඟනගේ රූපයක් තිබීම කැපී පෙනේ. සඳුන් ලීයෙන් නිමවා ඇති පිළිම දෙක අඩි තුන හමාරක් පමණ උස ඇත. පස්ගම දේවාලයෙහි තේවා කටයුතු භාර කපු මහතාගේ සහයෝගයෙන් එහි වැඩ සිටින නාථ ප්‍රතිමාව ද දැක බලා ගැනීමට අවස්ථාව ලැබුණි. උඩරට ජන කලාව අනුව නිර්මිත මෙහි වැඩ සිටින නාථ ප්‍රතිමාව හා තාරා දෙවඟන ප්‍රතිමාව සරල වාම් බවක් ගනී. මෙම ප්‍රතිමාවන්හි ඇඳුම් ආයිත්තම් රාජකීය ඒවා වේ. මුල් යුගයේ පැවැති ජටාමකුටය වෙනුවට ස්තූපයක් පවතී. පවතින විශ්වාසයට අනුව මෙම ප්‍රතිමාව නිමාවට පත් කර ඇත්තේ සඳුන් ලීයෙනි. මෙහි බදාම ආලේප කර සියුම්ව ලක්ෂණ නිරූපණය කර ඇත. කුමන හේතුවක් නිසා හෝ ප්‍රතිමා දෙකෙහි දෙඅත් කැඩී යාම නිසා ඒවා පිළිසකර කළ බවක් ද පෙනේ. එමඟින් පිළිමෙහි පැවැති කලාත්මක බව ගිලිහි ගොස්ය. අභය මුද්‍රවෙන් වැඩ සිටින මෙම ප්‍රතිමා දුර්වර්ණ වී ඇත්තේ මුල් අවධියේ පහන් හෝ හඳුන්කූරු වැනි දෑ පත්තු කිරීම නිසා විය හැකිය. ඍජු ස්වරූපයක් ගන්නා නාථ ප්‍රතිමාවෙහි ආභරණ ද පැළඳ ඇත. මුල් ස්වරූපය හොඳින් පැවතියා නම් මෙහි කලාත්මක බව හොඳින් සුරක්ෂිත ව පවතින බව පෙන්වා දිය හැකිය. පිළිමය තුළින් ගම්පොළ යුගයේ ප්‍රතිමා ශිල්පයේ ලක්ෂණ විදහා පෙන්නුව ද, ඉදිරිපස පිහිටි කලාත්මක ගජසිංහ රූප මහනුවර යුගයේ නිර්මාණ ශෛලිය නිරූපණය වන බවට විශ්වාස කළ හැකිය. අලංකාර කඳු ගැටයක් මධ්‍යයේ පිහිටි දේවාලයට ප්‍රවේශ වීම පිණිස පියගැට පෙළක් ඇත. පියගැටපෙළ පාමුල කුඩා කැබලිවලට බිඳුණු සෙල් ලිපියකි. එහි කුඩා අක්ෂර කැබලි ඇති අතර ඒවා සංස්කෘත අක්ෂරය. කුමන යුගයකට අයත් දැයි කිව නොහැකි වුවත් ඉන් කියවෙන්නේ මෙම දේවාලයෙන් බදු අය නොකළ යුතු බවකි.

පස්ගම නාථ දේවාලය පසුපස ම දැඩිමුණ්ඩ දේවාලයකි (හෝල්ට් 1994:215). නාථ දෙවියන්ගේ අරක්ෂකයා වශයෙන් සැලකෙන්නේ දැඩිමුණ්ඩ දෙවියන් ය. අචාර්ය ජොන් හෝල්ට් පවසන්නේ "දැඩිමුණ්ඩගේ භීෂණ ගුණයෙන් ආධාරයක් අපේක්ෂා කරන ගැමියා පළමුවෙන් විහාරයට ගොස් බුදුන් වැඳී පින් රැස්කර ගනී. විහාරයෙන් බැස නාථ දේවාලයට ගොස් දැඩිමුණ්ඩ කරා යාමට අවසර ඉල්ලයි. පසුව අවසර ගෙන දැඩිමුණ්ඩ දේවාලයේ කපුරාල වෙත ගොස් තමා ආ කාරණය කියා ඊට ගැළපෙන යාතිකාවක් කරන ලෙස ඉල්ලා සිටී. මෙම ගනුදෙනුවේ දී බුදුන් වැඳීමෙන් ලත් පින් ද දැඩිමුණ්ඩ හට අනුමෝදනා කරනුයේ ඔහුගේ බලය තමා ඉල්ලා සිටින දේ කිරීමට තරම් වැඩි වන්නට ප්‍රාර්ථනා කරමිනි" (එම) යනුවෙනි. මෙම ප්‍රදේශය කෘෂිකාර්මික කටයුතු සඳහා වඩාත් ප්‍රසිද්ධ ය. නාථ දෙවියන්ගේ අනුහසින් ප්‍රදේශවාසීන්ගේ ගොවිතැන් සරු කර ගැනීමට භාරහාර වීම් ද දක්නට ලැබේ. එම ස්ථානයට යන විට බෝග වගා කර පළමුව ලබාගත් මුල් අස්වැන්න (අගසස් දන්) දේවාලයට ගෙනවිත් පැවති අයුරු දක්නට ලැබුණි. එපමණක් නොව මිනිසුන්ගේ දෛනික ජීවිතය තුළ ඇති වන ගැටලු සඳහා විසඳුම් ලබාගැනීම පිණිස මෙම දේවාලයට පැමිණෙන පිරිස අතිමහත් ය.

මෙම අධ්‍යයනයට භාජනය කළ ප්‍රධාන දේවාල අතර පස්ගම සහ දොඩම්වල නාථ දේවාල ඇසුරෙන් දැඩිමුණ්ඩ දෙවියන් ඇදහීම කැපී පෙනේ. නාථ දේවාලය ඇසුරෙන් දැඩිමුණ්ඩ දෙවියන් සඳහා විශේෂ ස්ථානයක් හිමිවන්නේ ඇයි ද යන්නත්, එමගින් සැලසෙන සෙත කවරක් ද යන්න අවබෝධ කර ගත යුතුය.සතර කෝරලේ අලුත්නුවර පිහිටි පැරණි ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලය මුල් කොට ගෙන අලුත්නුවර දෙවියන් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල තම අණසක පතුරුවාගෙන සිටින දෙවියෙකි (මාලිමගේ 1996:25). එසේ අණසක පතුරුවා සිටින දැඩිමුණ්ඩ දෙවියන් පිළිබඳ ව සමාජයේ පවතින විශ්වාසයක් ද ඉතා වැදගත් වේ. ලංකාරක්ෂික දේවතා සමූහයාගේ ප්‍රධාන ස්ථානය, විෂ්ණු කතරගම, නාථ, විභීෂණ යනාදීන්ට හිමිවෙන අතර ලංකාවාසීන්ගේ පුද පූජාවට, ඉල්ලීම් ඉෂ්ට කරලීමට සමත් වූ දේවතා සමූහයා අතර මුල්තැන දැඩිමුණ්ඩ දෙවියන්ට හිමිව ඇත. නම් රාශියක් දේවාතා බණ්ඩාරට ව්‍යවහාර වූ බව පැහැදිලිය. තෙද යුත් චණ්ඩිකම් නිසා "දැඩිමුණ්ඩ දෙවියෝ" නමින් ම ඉන්දියාවේ දී ප්‍රකට ව සිටි මොහු උගත් පක්ෂය විසින් අලුත්නුවර දෙවියෝ නමින් හඳුන්වනු ලැබේ. දැඩිමුණ්ඩ නාමයට සලකනු ලබන්නේ භයජනක සහසිකයකු මෙනි. අලුත්නුවර දෙවියන් සැලකෙන්නේ අයුක්තියට දඬුවම් දෙන, කාගේත් දුක්ගැනවිලි ගැන සලකා බලන මහා කරුණාවන්තයකු මෙනි. දඬුවම් ආදිය කරවා ගැනීමට අයුක්තියේ දී අනුකම්පා විරහිත ව කටයුතු කරන දෙවියන් ලෙස ඔවුහු යොදා ගත්හ. මෙබඳු දෙවියෙකි දැඩිමුණ්ඩ (එම, 27).

දැඩිමුණ්ඩ යනු තවමත් බොහෝ දෙනෙක් යක්ෂයකු හැටියෙන් සිතා සිටිති. දොළහ දෙවිවරුන් අතර ද සිටින බලවත් මේ දෙවිඳු කතරගම දෙවියන්ගේ සෙනවිරත් ලෙසත්, වෙසමුණි ගේ මුණුබුරා ලෙසත් හඳුන්වා තිබේ තවත් වරෙක ඔහු උපුල්වන් දෙවියන්ගේ අමාත්‍යවරයා ලෙස ද සැලකේ. නීතිය හා සම්මතය කඩකරන සතුන් හට දඬුවම් දීමත්, යක්ෂ සේනාව පාලනය කිරීමත් මොහු ගෙන් සිදුවන බැවින් මොහු සෙනවිරත්න අධිකාරම් යනුවෙන් ද හඳුන්වා ඇත (ධර්මදාස සහ තුන්දෙණිය 1994:231).

මෙලෙස ජන සමාජයේ වන්දනයට පාත්‍ර වූ දැඩිමුණ්ඩ දෙවියන් වන්දනයේ ප්‍රධාන මූලස්ථානය වන්නේ අලුත් නුවරයි. ක්‍රි. ව. දහතුන් වන සියවසේ අග භාගයේ දී දෙවුන්දරින් දේවාභරණ වැඩමවා උපුල්වන් දේවාලය පද්දාවෙල හෙවත් අලුත්නුවර ආරම්භ වේ (සීලවිමල 2006:161). එතැන් පටන් මෙම දෙවියන්ගේ බල ප්‍රදේශය අලුත් නුවර සංකේන්ද්‍ර කොට මැදරට ප්‍රදේශයේ ව්‍යාප්තියට පත්විය. පළමුව උපුල්වන් දෙවියන්ගේ හා පසුව විෂ්ණු දෙවියන්ගේ අමාත්‍යවරයා ලෙස ඇතිවූ පිළිගැනීම හේතු කොට දෙවුන්දර, මහනුවර, ගඩලාදෙණිය, ලංකාතිලක, හඟුරන්කෙත හා දඹුල්ල යන ප්‍රධාන පෙළේ විෂ්ණු දේවාල ආසන්නයේ දැඩිමුණ්ඩ දේවාල ද ඉදිවී තිබෙනු දැකිය හැකිය. දැඩිමුණ්ඩ ඇදහිල්ලේ ප්‍රාදේශීය වෙනස්කම් පවතින බවට මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස විසින් පෙන්වා දෙනු ලබයි (ධර්මදාස සහ තුන්දෙණිය 1994:231).

මෙම පර්යේෂණයට භාජනය කළ ප්‍රධාන වශයෙන් පස්ගම දේවාලයට යාබදව දැඩිමුණ්ඩ දේවාලයක් පවතින අතර දොඩම්වල නාථ දේවාලය ඇසුරෙන් ද මෙම දෙවියන් වන්දනයට ලක් වේ. හෝල්ට් දක්වන ආකාරයට පස්ගම නාථ දේවාලය වෙත පැමිණි ජනතාව වෙනත් අරමුණු අරබයා දැඩිමුණ්ඩ දේවාලයට ගොස් ඇත. නාථ දෙවියන් බැතිමතුන්ට පිහිට හා ආරක්ෂාව සපයමින් සෙත සලසන දෙවියෙකි. නාථ දේවාලයක් ඇසුරෙන් දැඩිමුණ්ඩ වන්දනය සිදු වන්නේ ඇයි ද යන්න හඳුනාගත යුතුය. ප්‍රධාන වශයෙන් නාථ දේව වන්දනයේ නිරත වන යම් බැතිමතෙකුට යම් අනදරයක්, සොරකම්, මිනීමැරීම් යනාදිය සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් සැලකර සිටින්නේ මෙම දැඩිමුණ්ඩ දෙවියන්ට ය. පුද්ගලයන් සතු දේපල, හරකාබාන, භවබෝග සම්පත් පුද්ගල ක්‍රියාකාරිත්වය නිසා අහිමි වුවහොත් ඒ පිළිබඳ නාථ දෙවියන්ට පළමුව කන්නලව් කෙරේ. එසේ කන්නලව් කර දෙවනුව අදාළ සිද්ධියට සම්බන්ධ පුද්ගලයාට දඬුවම් කිරීම හෝ නැති වූ දෙය නැවත ගෙනැවිත්දීම වැනි කාර්යයන් පවරන්නේ දැඩිමුණ්ඩ දෙවියන් වෙතය. වර්තමානයේ ද දොඩම්වල හා පස්ගම දේවාල ඇසුරෙන් මෙම කාර්යය විධිමත් පරිදි සිදු කෙරේ. නාථ දෙවියන් මෛත්‍රී ලෙස වැඩ කළත් මෙවැනි පුද්ගල ක්‍රියාවන්ට අනුබල දෙන්නේ ඇයි ද යන්න ගැටලුවකි. යම් සිදුවීමක් කළ

කෙනෙකුට පිහිට වුවත් තව අයෙකුට හිරිහැරයක් නිතැතින් සිදුවේ. දොඩම්වල දේවාලය මගින් යම් දෙයක් සොරාගෙන ඇත් නම් හෝ බැතිමතා දක්වන තොරතුරු අනුව අනිවාර්යයෙන් ම වරදකරුට දඬුවම් කරන ලෙස දැඩිමුණ්ඩ දෙවියන්ට පැවසේ. මෙහි පළිගැසීම ප්‍රබලව කරන කාර්යයකි. එම ස්ථානයට එවෙනි අවස්ථාවක ගිය විට, කපු මහතා ප්‍රකාශ කළ කන්නලව්ව ශ්‍රවණය කරගෙන සිටීමට නොහැකි තරම් බියකරු ය. එසේ කිරීමෙන් අපරාධකරුට අනිවාර්යයෙන් ම දඬුවම් ලැබෙන බවට ප්‍රදේශ වාසීන් තුළ දැඩි විශ්වාසයක් පවතී. එහෙත් කපු මහතාගේ රාජකාරිය වන්නේ බැතිමතාගේ අවශ්‍යතාවට ඇහුම්කම් දීම පමණි.

දෙවියන් උදෙසා පවත්වන භක්ති පූර්වක පූජා ක්‍රම හා චාරිත්‍ර විධි තුළ කාලය හා වේලාවන් සම්බන්ධ කොට සලකන විට ඒවා වෘත්තාකාර පිළිවෙළ රටාවක් අනුව සිදු කෙරෙන බව හෙළි වේ. මේ අනුව වර්ෂයක් තුළ සිදුවන චාරිත්‍ර හා පූජා ක්‍රමයන් දෛනික සතිපතා හා වාර්ෂික වශයෙන් පවත්වනු ලබන ඒවා වශයෙන් බෙදා දැක්විය හැකිය. මෙයින් දෛනික පූජා හා චාරිත්‍ර හැරුණු විට සතිපතා හා වාර්ෂික ක්‍රියා දාමයෙහි දවස්, නැකැත්, මූර්ත, ග්‍රහචක්‍ර හා ඍතුචක්‍ර යන ජ්‍යෝතිෂ්‍යය සාධක ද අභ්‍යන්තර හා බාහිර වශයෙන් ද බෙදා වෙන් කළ හැකිය. මෙම බෙදීම තුළ ඇත්තේ දේවාලයේ ගර්භ ගෘහය හෙවත් වැඩ සිටින මාළිගාව හා ඉන් පිටත යන අදහස ය. දේවාලයේ ගර්භ ගෘහය වෙත පිවිසිය හැක්කේ කපුරාළ මහතුන්ට පමණි. දෛනික දේවාලයේ රාජකාරිවල නිරත වන ඇතුළ් කට්ටලයේ නිලකාරයන් හට ද ගර්භ ගෘහය තුළට ප්‍රවේශවීමට අවසර නොලැබේ. දෛනික තේවා කටයුතු හා වාර්ෂික නානුමුර මංගල්‍යයේ චාරිත්‍ර සිදුකරනු ලබන්නේ ගර්භ ගෘහය තුළ වන අතර මෙම අවස්ථාව නැරඹීමට බාහිර පුද්ගලයන්ට අවසර නැත. බාහිර පුද්ගලයන් උදෙසා කෙරෙන පූජා හා යාතිකාවන් ගර්භ ගෘහයෙන් පිටත සිදු කරනු ලබයි. මෙවෙනි පිළිවෙත් අනුගමනය කරන්නේ දේවාලය තුළ පවත්නා පාරිශුද්ධිය පිළිබඳ අනුගමනය කරන චර්යා ධර්මයන් මූලික කොට ගෙන බව වැඩිදුරටත් විමසීමේත් පෙනී යනු ඇත.

දේවාලය තුළ අවධානය යොමු කරන ප්‍රධාන විනය වන්නේ පාරිශුද්ධිය යි. නාථ දේවාල චාරිත්‍රයන් තුළත් පූජා ද්‍රව්‍යය තුළින්, පුද්ගලයන්, දේවාල භූමිය හා දේවාලය පිහිටි ගම වශයෙනුත් මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ. දේවාලය පිරිසිදු ව තබා ගැනීමට කහ දියර ඉසීම හෝ කොහොඹ අතු එල්ලා තැබීමක් ද දැකගත හැකිය. තේවාකරුවන් හිස තලප්පාවක් බැඳීමේ අරමුණ හිසකෙස් වැටී අපවිත්‍ර වීමෙන් වැළැක්වීම ය. මුරුතැන් රාළ මුරුතැන් පිසීමේ දී කතා බහ නොකර සිටීමත්, මුඛවාඩමක් බැඳීමත්, දිනපතා ස්නානය කිරීමත් පරිශුද්ධත්වය උදෙසා පවත්වනු ලබන චර්යා ධර්මයන් ය. මුරුතැන් පූජාවට අළුවර්ග හෝ

පිළිවර්ග යොදා නොගන්නේ ද මෙම හේතුව නිසා ය. සැම විට ම මුරුතැන් පිළියෙල වන්නේ දේවාලයට අයත් මුළුතැන්ගේ තුළ වීම ද විශේෂ ය.

තේවා කටයුතු සඳහා සහභාගී වන පිරිස දැඩි සේ පරිස්සම් වන්නේ කිලිවලට හසු නොවී සිටීමට ය. මළ කිල්ලට හසු වූ අයෙකු තුන් මසක් යන තුරු තේවා කටයුතුවලින් ඈත් වී සිටිය යුතු බවට පිළිගත් විශ්වාසයකි. ඇතැම් තේවා කටයුතු භාර ප්‍රධාන කපුමහතා යම් අයෙකු මිය ගිය හොත් ඒ සඳහා සහභාගී වීමට පවතින අවකාශ ඉතා අඩුය. දෙවියන් උදෙසා කැපවී සිටිය ද ගමේ මෙවැනි කටයුතු සඳහා සහභාගී නොවීමෙන් සමාජමය වශයෙන් යම් ගැටලු රැසකට මුහුණපාන බවට ඔවුන්ගේ මතය වේ. මළ කිල්ල හැරුණු විට වැදුම් කිල්ල, කොටහළු කිල්ල, ස්ත්‍රීන්ගේ මාසික ශුද්ධිය, මෛථුන්‍යය යනාදිය කිළි වශයෙන් සැලකේ, කිලිවලට හසු වී දේවාලවල කටයුතු කිරිම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙසත්, මිය යාමට පෙර දුක්විඳ මියයන බවත්, වස් දොස් වැදීමට හේතුවක් බවත් තේවාකරුවන්ගේ මතය වේ. අදට ද මේවා වෙනස් නොවී පවතී. අපිරිසිදුව පැමිණීමෙන් යම් අනර්ථයක් සිදුවන බවට බොහෝ දෙනා පිළිගනිති. එහෙත් සමාජය නවීකරණය වීමත් සමග මෙවැනි විශ්වාසයන් නොපිළි ගන්නා සමාජයක් ද ගොඩනැගී ඇත. මෙම පසුබිම තුළ සිට මස්ගම නාථ දේවාලයේ පූජා චාරිත්‍ර පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. නාථ දෙවියන් උදෙසා මහත් බැතියෙන් ඉටුකරනු ලබන පූජා චාරිත්‍ර ප්‍රධාන අලුත් සහල් මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය කාර්තික මංගල්‍යය සහ පෙරහැර මංගල්‍යය යන ඒවා ප්‍රධාන වේ. සෙසු නාථ දේවාලයන්හි පවත්වන පූජා චාරිත්‍ර අතර සමාන බවක් තිබුණ ද මෙහි ක්‍රියාත්මක කිරීමේ දී වෙනස්කම් දක්නට ඇත.

නව වසර උදාවීමෙන් පසු ඒ ඒ කෙම්මුර දිනයන්හි ප්‍රදේශවාසී බැතිමතුන්ගේ අවශ්‍යතා උදෙසා දේව පූජා පැවැත්වීම සමාන්‍ය සිදුවීමකි. එනමුත් පස්ගම දේවාලය පිහිටි ප්‍රදේශය ඉතා සාර්ථකව කෘෂිකාර්මික කටයුතු සිදුකරයි. මහා කන්නයේ අස්වැන්න නෙළා ගෙන මාර්තු හෝ අප්‍රේල් මස යෙදෙන සුබ දිනයක අලුත් සහල් මංගල්‍යය සිදුකරනු ලැබේ. මෙම කාර්යය කිරීමට දළදා මාළිගාවෙන් හාල් සේරු එකක් ලබාදේ. මාළිගාවෙන් ලබාදෙන සුබ දිනයට එකී කටයුත්ත සිදු නොවන බවට තේවාව භාර එච්.එම්. අබේරත්න බණ්ඩා මහතා ප්‍රකාශ කළේය (අබේරත්න බණ්ඩා 2014.03.15: සාකච්ඡාව). ඊට හේතු වන්නේ සුබ දිනය යෙදෙන්නේ අඟහරුවදා හෝ ඉරිදා වැනි දිනයක් වන නිසා බවය.

දේවාලය භාර කපුමහතා විසින් යොදා ගන්නා සුබ දිනයේ මෙම පූජාව පවත්වනු ලැබේ. ඊට හාල් සේරු පනහක් පමණ භාවිත කරන අතර අළු වර්ග හෝ බොඩ වර්ග ආශ්‍රිත වළවළු භාවිතයට නොගනී. අවශ්‍ය කැවිලි වර්ග හා අංග

සම්පූර්ණ මුළුතැන් පූජාවක් සකසා යොදාගත් කෙම්මුර දිනයේ එකී කටයුත්ත මහත් බැතියෙන් පැවැත් වේ. තොරතුරු ලබාගැනීම පිණිස මා එම දේවාලයට යන විට අලුත් සහල් මංගල්‍යයට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් සිටන අතර විශාල පිරිසක් රැස් ව සිටින අයුරු ද, දක්නට ලැබුණි. එකී සියලු ම පිරිසට දේව පූජාවෙන් කොටසක් ලබාදීමට කපු මහතා කටයුතු කිරීම අනිවාර්ය චාරිත්‍රයකි.

සිංහල දෙමළ අලුත් අවුරුද්ද උදාවී හිසතෙල් ගැල්වීම සිදු කරන දිනයේ දී මෙම දේවාලය ද අවුරුදු චාරිත්‍ර ඉටු කිරීමට වග බලා ගනී. හිසතෙල් ගෑමේ කටයුතු ද එදිනට මෙම දේවාලය මගින් ඉටු කරයි. එදින විශේෂ මුල්තැන් දානය, කැවුම්, කිරිබත් යනාදිය පිළියෙල කර දෙවියන් පිදීමක් දක්නට ඇත. එදිනට විශාල පිරිසක් ඒකරාශි වන බැවින් සිංහල අවුරුද්දේ රැස් ව සිටි සියලු ම දෙනාට කවර හෝ සංග්‍රහයක් කිරීමට කටයුතු කරන බව අබේරත්න බණ්ඩා කපු මහතා පැවසුවේ ය. තවද ආලෝකය ලබාදී දෙවියන් පිනවීම කාර්තික මංගල්‍යයේ ප්‍රධාන අරමුණ වේ. පස්ගම දේවාලයට ද මෙම පූජා චාරිත්‍රය ඉටු කිරීම පිණිස දළදා මාළිගාවෙන් තෙල් නැලියක් ලබාදේ. යෙදෙන සුබ නැකැත් දිනයේ සවස් කාලයේ දී පහන් දල්වා දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගනී.

මෙම දේවාලයෙහි ඉටු කරනු ලබන පූජා චාරිත්‍ර අතර ඉතා වැදගත් හා ප්‍රධානතම කාර්යයක් වන්නේ පෙරහැර මංගල්‍යයි. එය අත්‍යුත්කර්ෂවත් අයුරින් ඉටු කිරීමට දේවාලය භාර බස්නායකවරයාත් කපු මහතාත් වග බලා ගනිති. මෙහි රාජකාරී සේවා පැවතියක් අද වන විට එය සියයට 10ක් පමණ ක්‍රියාත්මක වන බවට කපු මහතාගේ අදහස වේ. ඇතැම් පිරිස් එකී කටයුතුවලට දායක නොවන බව ද ඔහු පවසයි. මහනුවර පෙරහැර කප් සිටුවන දිනයේ දී මෙම දේවාලය ද කප් සිටුවීමේ චාරිත්‍රය සිදු කරයි. ඒ සඳහා ඔවුන් යොදා ගන්නේ පාන්දර අල්ලේ රේඛා පෙනෙන වේලාවයි. කිරි ගසක් සොයා විධිමත් ලෙස අවශ්‍ය පරිදි සකසාගෙන සුබ මොහොතින් කප සිටුවා මසක් තුළ පෙරහැර මංගල්‍යය හොඳින් සිදු කරන බවට දෙවියන්ට පොරොන්දු ලබාදේ. මෙම දේවාලයේ ද ප්‍රධාන පෙරහැර 16 ක් පවත්වනු ලැබේ. එනම් දේවාලේ පෙරහැර (5) කුඹල් පෙරහැර (5) රන්දෝලි පෙරහැර (5) සහ දවල් පෙරහැර යනුවෙනි. පුරා දින පහක් දේවාලේ පෙරහැර පවත්වන අතර ඒ සඳහා ඇතුළු කට්ටලේ දොළොස් දෙනා පමණක් සහභාගී වීම දක්නට ලැබේ. අත් පන්දම්, මුර ආයුධ රැගෙන යමින් එකී පෙරහැර පැවැත්වීම විශේෂ ය.

ඉන් අනතුරු ව උදා වන්නේ කුඹල් පෙරහැර චාරිත්‍රයයි. පස්ගම දේවාලයේ පෙරහැර සීමාව ලෙස ගැනෙන රිට්ටාගේ පිහිටා ඇත්තේ අලංකාර වෙල්යායක් මධ්‍යයේ ය. චාරිත්‍රයක් ලෙස පෙරහැර පහක් ගිය ද එක ම දිනයේ පෙරහැර

දෙවතාවක් සිදුකිරීම විශේෂ ය. එය රජුගේ නියෝගය පරිදි ඉටු කරන බවට විශ්වාස කෙරේ. පස්ගම දේවාලයේ බස්නායකවරයා ද රන්දොලි පෙරහැර අත්‍යුත්කර්ෂවත් අයුරින් ඉටු කිරීමට වගබලා ගනී. මේ සඳහා අලිඇතුන්, උඩරට නැටුම් ශිල්පීන් වැඩි වශයෙන් යොදා ගැනීම සමාන්‍ය සම්ප්‍රදාය වේ. රන්දොලි පෙරහැර දිනයේ දී විශේෂ අවධානයක් දෙවියන් වැඩම කරවන ඇතා සම්බන්ධයෙන් යොමු වේ. පෙරහැරට ඇතුන් සැරසීමට පෙර දවුලෙන් "ඇත්දූම" ලෙස ව්‍යවහාර කරන බෙර පදයක් වාදනය කරනු ලැබේ. මෙම සිදුවීමට දීර්ඝ ඉතිහාසයක් ඇත. පස්ගම දේවාලේ ආභරණ වැඩම කරවීම පිණිස වනයේ සිටි ඇතෙකු මීට වසර තුන්සීයකට පෙර පැමිණි බවට ජනතාව අතර කතාවක් පවතී. එම ඇතාට ලබාදුන් සංඥා බෙර පදය ඇත්දූම ලෙස හඳුන්වයි. මෙම කථාව ජනප්‍රවාදයක් ලෙස සිතීමට අපහසු වන්නේ ඇතුළ් කට්ටලේ රාජකාරී ඉටු කරන හේවාවිස්සේ පදිංචි ගමරාළ කෙනෙකුගේ නිවසේ එම ඇතාගේ යැයි විශ්වාස කරන දළ යුවල අද ද දක්නට ලැබෙන බැවිනි. රන්දොලි පෙරහැර ද එක ම දිනයේ දෙවතාවක් පැවැත්වීම පස්ගමට ආවේනික චාරිත්‍රයකි. පස්ගම දේවාලේ පෙරහැරට දැනට වසර හැටකට පමණ ඉහත සිට ආසන්නයේ ඇති විහාරයෙන් ද පෙරහැර සම්බන්ධ වීම ද කැපී පෙනේ.

රන්දොලි පෙරහැර හමාර වී පසු දින දිය කැපීම ද ඉතා වැදගත් චාරිත්‍රයකි. දිය කැපීම සඳහා යොදා ගන්නා ගංතොටට වන්නෙ මා ඔයයි. එම ස්ථානය යොදා ගැනීමට විශේෂ හේතුවක් නොමැත. විශාල දුරක් ගෙවා එම ස්ථානයට ළඟා විය යුතුය. අවසන් රන්දෝලි පෙරහැර හැකි විගස නිමවා අදාළ තොටට ඉතා කඩිනමින් පිරිස පිටත් වෙති. හඟුරන්කෙත පවතින විෂ්ණු, පත්තිනි දේවාලවලින් ද දිය කැපුමට පැමිණෙන්නේ මෙම ස්ථානයටයි. එබැවින් තමන්ගේ බලය, ශක්තිය පෙන්වීමට එකිනෙකා ගොස් හෝ පළමුවෙන් ම එම ස්ථානයට ළඟාවීමට උත්සාහ කිරීමක් අද ද දක්නට ලැබේ. මේ ආකාරයෙන් දිය කපා ගෙනවිත් දෙවියන්ට වූ පොරොන්දුව නිමා කර පෙරහැර මංගල්‍යය හමාර කරයි. මේ අයුරින් පස්ගම නාථ දේවාලයේ වාර්ෂික ව දෙවියන්ට පූජා චාරිත්‍ර පවත්වනු ලැබීම කැපී පෙනෙන සිදුවීමකි.

මෙම දේවාල තුළ පැවැත්වෙන ප්‍රධාන පූජා චාරිත්‍ර සඳහා අවශ්‍ය නැකැත් ලබා දෙන්නේ දළදා මාලිගාව මඟිනි. අලුත් සහල් මංගල්‍යයට අවශ්‍ය සහල් ලබා ගැනීම පිණිස අලංකාර පෙරහැරක් ගුරුදෙණියට අතීතයේ සිට ගොස් ඇත. දළදා මාලිගාවේ ප්‍රධාන අටුව පිහිටා ඇත්තේ ගුරුදෙණියේ ය. මහනුවර නාථ දේවාලය මෙම චාරිත්‍ර අඛණ්ඩ ව ඒ ආකාරයෙන් ම සිදු කළත්, පස්ගම, වේගිරිය, දොඩම්වල එම දේවාල පෙරහැර මංගල්‍ය පවත්වන්නේ නැත. බසයෙන් ගොස් ලබාදෙන සහල් රැගෙන ඒමට කපුමහත්වරු ක්‍රියා කරති. එසේ වීමට හේතු විමසීමේ දී

පෙන්වා දෙන්නේ එම චාරිත්‍ර කිරීමට අවශ්‍ය තරම් මුදල්, පිරිස් හා බලය අඩුවීමත් සමාජ ක්‍රමය දිනෙන් දින සිදු වන වෙනස්කම් නිසා බවත්ය.

වසරකට වරක් යෙදෙන පෙරහැර මංගල්‍යය නිමා කර දේවාලයේ ගිහි භාරකරු බැහැදැකීමට යෑම රාජකාරි ඉටු කළ සැමගේ ම වගකීමකි. තමන් නියෝජනය කරන කුල රටාව අනුව ඇඳුම පැළඳුම් ඇද මෙම ගමන ගොස් තිබේ. මෙම ගමන තුළින් සාම්ප්‍රදායික වැඩවසම් සමාජ ක්‍රමය මැනවින් විදහා පෙන්වා ඇත. එසේ යෑමේ දී රැගෙන යා යුතු ද්‍රව්‍යය පිළිබඳ ව ද මහනුවර ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇති ප්‍රවේනි ලේඛනයේ ද තොරතුරු සඳහන් වේ. කපු මහත්වරුන් පෙන්වා දෙන ආකාරයට අද මෙම ගමන සාම්ප්‍රදායික චාරිත්‍රයක් බවට පත්ව ඇත. ඊට හේතු වී ඇත්තේ පුද්ගලයා ස්ව කැමැත්තෙන් සම්බන්ධ නොවීමයි. කුල රටාව නියෝජනය කිරීමත් ද දක්නට නැත. දිනෙන් දින මේවා හා බැඳී පවතින පිළිවෙත් ඉවත් ව යන බවක් දැකගත හැකිය. මෙම පසුබිම තුළ දේවාලයක් ලෙස නිසි අයුරින් පවත්වාගෙන යෑම මහත් අභියෝගයකි. එමෙන් ම මෙම ගැටලු මෙකී දේවාලයට පමණක් නොව දිවයින තුළ පිහිටි විහාර දේවාලගම් මුහුණපාන ප්‍රධාන අභියෝග ලෙස පෙන්වා දිය හැකිය.

**නිගමනය**

මහනුවර රාජධානි සමයේ ජනප්‍රිය වූ නාථ දෙවියන් ක්‍රමිකව එකි ප්‍රදේශය ඇසුරෙන් ම ප්‍රචලිත වී පවති. දුම්බර ප්‍රදේශයේ වැඩසිටි නාථ දෙවියෝ පස්ගමට පසුබසින්නේ පිටියේ බණ්ඩාර හා ඇතිකරගත් ගැටුම නිසාය. එතැන් පටන් පස්ගම නාථ දෙවින්ගේ අඩවිය බවට පත්වේ. ඓතිහාසික වශයෙන් වැදගත් ස්මාරක රැසක් මෙම ස්ථානයේ දක්නට ඇත. ඇතැම් අංග විනාශ වෙමින් ද පවති. එහි පැවති ඉපැරණි ඇත් දළ යුවල ද පසුගිය දිනක අපට අහිමි විය. මෙම නාථ දේවාලය වාර්ෂිකව සතර මංගල්‍ය ඉටු කළත් එහි එකිනෙකට වෙනස්කම් සිදුවී ඇත. දළදා මාළිගාව මූලිකව මෙම දේවාලයේ ද පූජා චාරිත්‍ර ඉටු කරයි. වර්තමානය වන විට එම පිරිස් දේවාල රාජකාරියෙන් දුරස්ථව ඇත්තේ සමාජය නවීකරණය වූ නිසාය. මෙම පසුබිම තුළ නාථ දේවාලය ප්‍රශ්න රැසකට මුහුණ දී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

*මහාවංසය* (1996), සංස්. හික්කඩුවේ සුමංගල හා බටුවන්තුඩාවේ, එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ.

අභයවර්ධන එච්.එම්.පී. (2004), *කඳුරට ප්‍රවේණිය*, ශ්‍රී ලංකා මහා බැංකුව, රාජගිරිය.

අස්සජි, තල්පේ (1998), *ජනකවිය දෙවියෝ සහ යක්ෂනියෝ*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

කරුණාතිලක, ඒ.ඩී.පී. (1985), සෙංකඩගල ඉතිහාසය, සිතුමිණ, මහනුවර.

ජයවර්ධන, එස්.කේ. (1985), *පැරණි ලංකාවේ ආගමික පුද සිරිත්*, ගුණසේන සහ සමාගම, කොළඹ.

ධර්මදාස, කේ.එන්.ඕ. සහ එච්.එම්.එස්. තුන්දෙණිය (1994), *සිංහල දේව පුරාණය*, මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක.

සීලවිමල, බෝගොඩ (2006), *බෞද්ධ ප්‍රතිමාසරයට පිවිසි හින්දු දෙවියෝ*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සුනිල්, ඕ. (2001), *දැඩිමුණ්ඩ දෙවියෝ*, කතෘ ප්‍රකාශන.

මාලිමගේ, අසෝක (1996), *වන දුනුදෙවි*, එස්. ගොඩගේ හා සමාගම, කොළඹ, .

හොල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ් (1994), *මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය*, පරි. පී.බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

මෙම දේවාලයේ ප්‍රධාන කපු මහතා වන එච්.එම්. අබේරත්න බණ්ඩා සමඟ 2014.03.15 දින සිදු කළ සාකච්ඡාව ඇසුරෙන් ලබාගත් තොරතුරු.